www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා මිලිටරිය කොළඹ පැල්පත්වාසීන් දහස් ගණනක් අපරාධකරුවන්සේ සලකා කොටු කරයි

## Thousands of Colombo slum dwellers rounded up by Sri Lankan military

ඩබ්ලිව්. ඒ. සුනිල් හා පානිනී විජේසිරිවර්ධන විසිනි

2010 ජුලි 10

පසුගිය සතියේ උතුරු කොළඹ මට්ටක්කුලියේ මිනිසුන් සියගනනකට සාහසික ලෙස පහරදුන් ශ්‍රී ලංකාවේ මිලිටරිය සහ පොලිසිය අනතුරුව නිවැසියන් දහස් ගනනක් අපරාධකරුවන්සේ සලකා පිටියකට කොටු කරනු ලැබූහ.

අත්අඩංගුවට ගනු ලැබූ ප්‍රදේශයේ තරුනයෙකුට පොලිසිය විසින් පහර දීමට එරෙහිව සිය ගනනක් මිනිසුන් විරෝධතා දැක්වීමෙන් පසු සෙනසුරාදා (3) රාත්‍රියේ පහර දීම ආරම්භ කෙරින. දහසකට අධික සොල්දාදුවන් හා පොලිස් කැරැලි මර්දන කල්ලි ඇතුලු ආරක්ෂක භටයන් ප්‍රදේශයේ ජනයාට එරෙහිව ස්ථාන ගත කෙරින.

පසුදා උදෑසන ප්‍රදේශයේ නිවැසියන් 8,000ක් පමන විවෘත ක්‍රීඩා පිටියකට ගාල් කෙරුනු අතර ගෝනිබිල්ලන් කීප දෙනෙකු විසින් නම්කල 200 කට අධික පිරිසක් ඒ අනුව පොලිස් අත්අඩංගුවට ගැනින.

මෙම මිලිටරි-පොලිස් මෙහෙයුම ජනාධිපති රාජපක්ෂගේ ආන්ඩුව වැඩ කරන ජනයාට සහ තරුනයින්ට එරෙහිව දියත් කරන මර්දන පියවරයන් හි නව අවධියක් සලකුනු කරයි. එය ශ්‍රී ලංකාවේ පැන නැගෙමින් පවතින පොලිස්-රාජ්‍ය පාලනය පිලිබඳ තවත් ප්‍රකාශනයකි.

අඟහරුවාදා සහ බදාදා (6-7) දිනවලදී ලෝක සමාජවාදී වෙබ් අඩවි වාර්තාකරුවන් එහි යන විටත් උවදුරේ සලකුනු දැකිය හැකි විය. ප්‍රදේශයට ප්‍රවේශ වන සෑම ස්ථානයකම සන්නද්ධ භටයන් විසින් මුර කෙරින. බිඳුනු වීදුරු සහිත හානියට පත් වාහන වීථිවල අතහැර දමා තිබින. කැඩුන ජනේල සහ දොරවල්,



හානියට පත් වැන් රථයක්

නිවැසියන්ගේ ගෙවල්වලට එල්ල කෙරුනු ආරක්ෂක බලකායන්ගේ ප්‍රහාරයේ රුදුරු බව විදහා දැක්වී ය. ඇතැම් නිවාසවල රූපවාහිනී, ශීතකරන සහ ගෘහ භාන්ඩ ඇතුලු සියලු දෙයම පාහේ යලි ප්‍රතිසංස්කරනය කිරීමට නොහැකි වන පරිදි හානිකොට තිබින. බොහෝ නිවැසියන් ඉමහත් කෝපයට පත්ව සිටි අතර ඇතැමුන් දරුනු ලෙස භීතියට පත්ව සිටියහ.

නිවැසියන්ගෙන් ලබා ගත් තොරතුරුවලට අනුව පෙනී යන්නේ ආයෝජකයින් හා දේපල සංවර්ධකයින් වෙනුවෙන් කොළඹ නගරයේ පැල්පත් ඉවත් කිරීම සඳහා රාජපක්ෂ ආන්ඩුව ගෙනයන වැඩ පිලිවෙලට ඉලක්ක වී තිබෙන පැල්පත් ප්‍රදේශයක් තුල කරන ලද මෙම මෙහෙයුම පසුවට දියත් කෙරෙන පොලිස්-මිලිටරි මෙහෙයුම් සාධාරනීකරනය කිරීමට මට්ටක්කුලිය පොලිස් නිලධාරීන් සැලසුම් කල

ප්‍රකෝපකරනයක් බවයි.



එම්. නිශාන්ත

ජූලි 3 වෙනි දින සවස තරුන ත්‍රී-වීලර් රථ රියදුරෙකු වන එම්. නිශාන්ත පොලිසිය විසින් අත්අඩංගුවට ගැනුනේ ඔහු මත්කුඩු විකුනන්නෙකුය යනුවෙන් චෝදනා කරමිනි. අසල්වැසියෝ මෙම කියාපෑම මුලුමනින්ම ප්‍රතික්ෂේප කලෝය. නිශාන්තට පොලිසියේදී දරුනු ලෙස පහර දී ඇති බවත් පොලිස් භාරයේ සිටියදී අතුරුදහන්ව ඇති බවත් සැලවීමෙන් කෝපයට පත් ඥාතීන් හා ප්‍රදේශවාසීහු සිය ගනනක් පසුගිය සෙනසුරාදා විරෝධය දැක්වීමට පොලිස් ස්ථානයට එක්රැස් වූහ.

ජනකාය විසුරුවා හැරීමට සියගනනක් සන්නද්ධ සොල්දාදුවන් හා පොලිසිය කැඳවූ අතර අනතුරුව ත්‍රස්ත පාලනයක් මුදා හැරිනි. සිවිල් ඇඳුමින් සැරසුන ආරක්ෂක අංශ පුද්ලයින් ප්‍රදේශයට කඩා වැදී නිරායුධ මිනිසුන්ට ඉවබවකින් තොරව පොලුවලින් පහර දුන් බව ප්‍රදේශවාසීහු ලෝසවෙඅ ට ප්‍රකාශ කලෝය. බොහෝ නිවෙස්වලට සහ වාහනවලට යකඩපොලුවලින් පහර දී තිබින.

“අපට ගහන්න එපා, අපේ දේපලවලට හානි කරන්නත් එපා කියල අප ඔවුන්ට ආයාචනා කලා. ඒත් ඒ අය දිගටම පහර දුන්නා.” එක් කාන්තාවක් කෝපයෙන් කීවාය. “ආයුධ අතින් ගත්ත සොල්දාදුවො බලාගෙන ඉඳිද්දීයි ඔවුන් ගැහැව්වේ,” ඇය ප්‍රකාශ කලාය. පිරිමි ළමුන්ට හිරහැර සිදු කල අතර ඔවුන්ගේ හිසකෙස් බලෙන් කපා දැමූහ. ඇතැම් නිවැසියන්ගේ රන්භාණ්ඩ ආරක්ෂක අංශ පුද්ගයින් විසින් කොල්ල කන ලදි.



පොලිස් ප්‍රහාරයෙන් විනාශ කෙරුන රූපවාහිනිය සහ ගෘහ භාන්ඩ

පසුදා උදෑසන 7.30ට පමන පලාතේ වයස දහයෙන් ඉහල සියලුම පුරවැසියන් පොලිසිය විසින් යාබද පිටියකට ගාල් කරන ලදහ. සමිට්පුර, ගැමුනුපුර, කදිරාන සහ ශ්‍රීවික්‍රමපුර යන නිවාස ප්‍රදේශවල 8,000ක පමන ජනයා මෙලෙස වට ලනු ලැබීය. දහසක පමන පොලිස් හා ආරක්ෂක නිලධාරීන් පිරිසක් වට ලනු ලැබූ පිටියේ වතුර බිඳකුදු නොලබා සවස 2 වෙන තෙත් ඔවුන් රඳවනු ලැබීය. ගෝනි බිල්ලන් 4 දෙනෙක් අත්අඩංගුවට ගැනීමට මිනිසුන් 200ක් පමන තෝරා ගත්හ.



පොලිස් කඩාපැනීමෙන් අවුල්කරන ලද නිවස

සමස්ත මෙහෙයුම ම දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයට (එල්ටීටීඊ) එරෙහි දශක තුනක යුද කාලපරිච්ඡේදය අතරතුර උතුර සහ නැගෙනහිර දෙමල වැසියන්ට එරෙහිව ගෙනයන ලද බලෙන් කොටුකිරීම් සිහිපත් කලේය. මේ වනවිටත්, දෙමල වැසියන් දහස් ගනනක් මිලිටරිය විසින් පවත්වා ගෙන යනු ලබන රැඳවුම් කඳවුරුවල රඳවා සිටින අතර තවත් දහස් ගනනක් “එල්ටීටීඊ සැකකරුවන්” ලෙස නඩු දැමීමක් නොමැතිව, අවිනිශ්චිතව සිරභාරයට පත් කර තිබේ.

සිංහල, දෙමල සහ මුස්ලිම් යන සමස්ත කම්කරු පන්තියටම එරෙහිව යොදාගැනීමට අවශ්‍ය මර්දනයේ නව විධික්‍රම වර්ධනය කිරීමේ පුහුනු බිමක් වසයෙන් ආන්ඩුව සිවිල් යුද්ධය යොදාගෙන තිබෙන බැව් මට්ටක්කුලිය මෙහෙයුම දෙස් දෙයි. එමෙන්ම මෙම ප්‍රහාරය 1989-1990 ජීවිත 60,000ක් අහිමි කල රටේ දකුනේ තරුනයින්ට එරෙහිව ආරක්ෂක හමුදා විසින් ගෙනයන ලද කඩාපැනීම්වලට සමාන ය.

ප්‍රහාරය මත් ද්‍රව්‍ය අලෙවිකරුවන්ට එරෙහිව එල්ල කෙරුනක් යැයි කියමින් මෙහෙයුම යුක්ති සහගත කිරීමට පොලීසිය උත්සාහ කලේය. සාමාන්‍ය ජනයා වෙත මොනයම්ම හෝ ආකාරයේ පහර දීමක් සිදුව ඇතයි යන්න සඳුදා දින පුවත්පත් සාකච්ඡාවේ දී නියෝජ්‍ය පොලිස්පති (ඩීඅයිජී) එන්.කේ. ඉලංගකෝන් මුලුමනින්ම ප්‍රතික්ෂේප කලේය. අත්අඩංගුවට ගත් සැකකරු "ප්‍රධාන මත්ද්‍රව්‍ය ජාවාරම්කාරයෙකුගේ සහ පාතාල නායකයෙකුගේ" "ප්‍රධාන සහායකයෙක්" යැයි හෙතෙම කීවේය. පොලිස් මත්ද්‍රව්‍ය නිවාරන අංශයේ නිශාන්ත රඳවා ඇතයි ඉලංගකෝන් ප්‍රකාශ කලේය. කෙසේ වෙතත් නිශාන්තගේ මව ලෝසවෙඅට කීවේ, පොලිස් අත් අඩංගුවට ගත් තැන සිට ඇය පුතා නොදුටු බවයි.

ශ්‍රී ලංකා පොලිසිය ඔවුන්ගේ පහරදීම් යුක්තිසහගත කිරීමට මෙවැනි කතා ගෙතීමෙහි ලා කුප්‍රකටය. "ප්‍රධාන මත් ද්‍රව්‍ය ජාවාරම්කරු" අත් අඩංගුවට ගෙන නැත්තේ ඇයි දැයි පොලිස් අධිකාරී ඉලංගකෝන් කියන්නේ නැත. මෙහෙයුම වහං කරනු වස් හා ප්‍රදේශ වාසින්ගේ කෝපය යටපත් කිරීමේ වෑයමකින් පලාතේ සියලුම ජ්‍යෙෂ්ට පොලිස් නිලධාරීන් මෙන්ම මට්ටක්කුලිය පොලිසියේ නිලධාරීන් මාරු කර යැවීමට පොලිස්පති මහින්ද බාලසූරිය නියෝග කලේය.

පොලිසිය ඔවුන්ගේ ත්‍රස්තකිරීම අඛන්ඩව පවත්වා ගනිමින්, අත් අඩංගුවට ගත් ජනයා හඳුනා ගැනීමේ පෙරට්ටුවක් සඳහා රැඳවුම්භාරයේ තබා ගැනීමට උසාවි නියෝගයක් පනවන්නැයි ඉල්ලා සිටියේය. ඉදිරිපත් කර ඇති චෝදනා ඔප්පු කලහැකි ලෙස පොලිස් දේපලවලට කිසිදු හානියක් සිදුව ඇති බවට පොලිසිය කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නැතයි කී විත්තියේ නීතිඥයෝ විරුද්ධත්වය ප්‍රකාශ කලෝය. මහේස්ත්‍රාත්වරයා සිරකරුවන් 176 දෙනෙකුට ඇප දුන් නමුත් 25 දෙනෙකු සිරභාරයේ තැබුවේය.



වින්ඩ්ස්ක්‍රීනය කුඩු කරන ලද ත්‍රී-වීල් රථයක්

ප්‍රදේශයේ තරුනයෙකු ලෝසවෙඅට මෙසේ ප්‍රකාශ කලේය: "ආන්ඩුව යුද්ධ කාලයේදී "අපි වෙනුවෙන් අපි" වැඩසටහන පටන් ගන්න කොට අපට කිව්වේ හමුදාව අප ආරක්ෂා කරයි කියලා. දැන් අපට තේරෙනවා හමුදාව අප වෙනුවෙන් නෙවෙයි කියලා." යුද කාල පරිච්ඡේදයේදී උතුරේ අහිංසක ජනතාවට ආරක්ෂක භටයන් කෙසේ සලකන්නට ඇතිදැයි ජනතාවට දැන් වටහා ගත හැකි බව හිංසනයට ලක් වූ තවත් තරුනයෙක් කීවේය. "හමුදා භටයින් යුද අපරාධවල නිරත වුනේ නැතයි ආන්ඩුවේ කියාපෑම් විස්වාස කරන්න පුලුවන් කාටද?" ඔහු ඇසුවේය.

හමුදාවේ වියරු කඩා පැනීමෙන් බෙහෙවින්ම පීඩනයට ලක්වූයේ සමිට්පුර ය. එහි සිංහල, දෙමල හා මුස්ලිම් ඇතුලු පවුල් 6,000ක් පමන ජීවත් වෙති. බොහෝ පවුල් රැකෙන්නේ එදිනෙදා කුලී වැඩකින් ලැබෙන මුදලකිනි. 1976 දී, එවකට ආන්ඩුව, නොබැඳි ජාතීන්ගේ ව්‍යාපාරයේ සමුලුව සඳහා නගරය ශුද්ධ කිරීමේ දී ඇතැම් පෙදෙස්වලින් බලෙන් නෙරපන ලද ඔවුන් කිසිදු මූලික පහසුකමක් නොදී සමිට්පුරට ගෙනැවිත් දමන ලදි.

විශ්‍රාමික කම්කරුවෙකු ලෝසවෙඅට ප්‍රකාශ කලේ, "අවුරුදු ගනනාවක් තිස්සේ ලෑලිවලින්, ටකරන් තහඩු හෝ පොල් අතුවලින් තැනූ කුඩා පැල්පත්වල ජීවත්වීමට මිනිසුන්ට සිද්ධවුනා. මං මේ ගේ හැදුවේ මගේ සේවක අර්ථ සාධක අරමුදල අරගෙන" යනුවෙනි. මෙහි පදිංචිකරුවන්ට ඔවුන්ට ලබා දුන් කුඩා බිම්කඩ වෙනුවෙන් කිසිදු නෛතික ලියවිල්ලක් දී නැත.

පොලිස් අත්අඩංගුවට ගත් නිශාන්ත ජීවත් වන්නේ ඔහුගේ 64 හැවිරිදි මව සහ 13 හැවිරිදි දියනිය සමඟ වර්ග මීටර් 12ක වපසරියකින් යුත් කුඩා නිවසක ය. ඔහු පෙරකාලයේදී ගොන්කරත්තයකින් ගොස් භූමිතෙල් වික්කේය. ඔහුගේ මව තවමත් පවිත්‍රකරන්නියක ලෙස සේවය කරයි. ඔහුගේ බිරිඳ වසර තුනකට ඉහත දී ජෝර්දානයේ ගෘහ සේවයට පිටත්ව ගිය නමුත් ඇගේ හාම්පුතාගේ තාඩන පීඩනවලට ලක්ව එතැනින් පැන යාමට තැත් කිරීම හේතුවෙන් මාස 18ක් පුරා රැඳවුම් කඳවුරක සිරකරනු ලැබ සිටී.

මෙම දරිද්‍ර ජනයා කොලඹ වාසය කරන ලක්ෂ සංඛ්‍යාත පැල්පත් වැසියන්ට අයත් වෙති. රාජපක්ෂ ආන්ඩුව ඔවුන් වාසය කරන්නේ "අනවසර" නිවාසවලයැයි කියමින් මෙම පැල්පත් වැසියන් එලවා දැමීමට සැලසුම් සකස් කර තිබේ. මෙම සැලස්ම ක්‍රියාත්මක කිරීම පිනිස නාගරික සංවර්ධන අධිකාරිය ජනාධිපති සොහොයුරු, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ විසින් ප්‍රධානත්වය දරන ආරක්ෂක අමාත්‍යාංශයේ පාලනය යටතට පැවරීය.

පොලිස්-මිලිටරි බලය යෙදීම ශ්‍රී ලංකාව තුල තවදුරටත් සුවිශේෂ තත්වයක් නොව මෙය නීතියක් බවට පත්ව ඇත. මැයි මාසයේදී ආරක්ෂක අමාත්‍යාංශය මැද කොලඹින් පවුල් 45ක් එලවා දැමීමටත් ඔවුන්ගේ විරෝධය බිඳ දමා ඔවුන්ගේ නිවාස කඩා දැමීමටත් සියගනනක පොලිස් හා මිලිටරි කන්ඩායමක් යෙදෙව්වේය. කොලඹ සහ රටේ අනෙක් ප්‍රදේශවල දහස් ගනන් පදික වෙලෙඳුන් පලවා හැරීමට පසුගිය සතිවල පොලිසිය මෙහෙයවීය.

රාජපක්ෂ ආන්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබා ගත් ඩොලර් බිලියන 2.6ක නයෙහි කොන්දේසි සැපිරීමට අවශ්‍ය කෙරෙන දරුනු කප්පාදු පියවර ක්‍රියාත්මක කිරීමේ දී පැන නගින මහජන විරුද්ධත්වය සහ ප්‍රතිරෝධය මර්දනය කිරීම පිනිස, පොලිසියට හා මිලිටරියට අසීමිත බලතල ලබා දෙන හදිසි නීතිය, 2009 මැයි මාසයෙන් යුද්ධය කෙලවර වී තිබිය දී පවා, අඛන්ඩව පවත්වාගෙන යයි.

මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල වන ප්‍රහාරයන් තීව්‍ර වෙද්දී එකදිගටම ඒවා වහංගු කිරීමේ යෙදී සිටින කොලඹ මාධ්‍යයන් මට්ටක්කුලිය නිවැසියන් වෙත එල්ල කල ප්‍රහාරය පිලිබඳ පොලිසියේ අර්ථ කථනය පුනරුච්චාරනය කරමින් සිටී. පොලිස් රාජ්‍යයක් සඳහා වන සූදානමට ඔවුන්ගේ සහාය විදහා දක්වමින්, දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (යූඑන්පී) සහ සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජේවීපී) ඇතුලු කිසිදු පාර්ලිමේන්තු පක්ෂයක්, මට්ටක්කුලිය මෙහෙයුම පිලිබඳව කට ඇර නැත.

ශ්‍රී ලංකාවේ ආන්ඩුව ගැඹුරුවන ගෝලීය අර්බුදයේ බර රටේ මුලුමහත් වැඩකරන ජනයාගේ කරමත පැටවීමට දශක ගනනාවක සිවිල් යුද්ධයේදී ගොඩ නැගූ මිලිටරි යාන්ත්‍රනය යොදා ගනු ඇති බවට සමාජවාදී සමානතා පක්ෂය හා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කල අනතුරු ඇඟවීම මට්ටක්කුලිය මෙහෙයුමෙන් බරපතල ලෙස සනාත වී තිබේ.

කතුවරු පහත ලිපි කියවීම නිර්දේශ කරති.

කොලඹ තවත් බොහෝ පවුල් එලවා දැමීමට සැලසුම් කරයි

2010/06/25

ශ්‍රී ලංකා ආන්ඩුව පැල්පත් ඉවත් කිරීමේ මෙහෙයුම් පුලුල් කරයි

2010/06/12

ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශය කොලඹින් දුප්පතුන් පන්නා දැමීම අරඹයි

2010/05/24

© www.wsws.org